**ධීවර ත්‍යාග අරමුදල - 2020**
**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

ධීවර ත්‍යාග අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(5) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ලැබිය යුතු මසුන් අලෙවි ආදායම | 2,354,295 | උපලේඛන | කොවිඩ් තත්ත්වය හේතුවෙන් ත්‍යාගලාභීන් හා ගෙවිය යුතු මුදල් තීරණය කිරීමට නොහැකි වීම මත විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීම අපහසු වී ඇති බව. | ලැබිය යුතු මසුන් අලෙවි ආදායම පිළිබඳ විස්තරාත්මක උපලේඛන පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා | 1,244,460 | උපලේඛන | කොවිඩ් තත්ත්වය හේතුවෙන් ත්‍යාගලාභීන් හා ගෙවිය යුතු මුදල් තීරණය කිරීමට නොහැකි වීම මත විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීම අපහසු වී ඇති බව. | වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා පිළිබඳ විස්තරාත්මක උපලේඛන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | වර්තමානයේ දී කොපමණ නඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක වන්නේ ද, කොපමණ නඩු ප්‍රමාණයක් ක්‍රියාත්මක නොවන මට්ටමේ පවතින්නේ ද හා අවසන් වූ | - | විධිමත්ව යාවත්කාලීන කරන ලද වාර්තා | වර්තමානයේ පවතින නඩු සම්බන්ධයෙන් විස්තර සහිත ගොනු පවත්වාගෙන යනු ලබන බවත් ඒ අනුව මාසික හා ත්‍රෛමාසිකව සාරාංශ වාර්තා සකස් කරන බවත් උසාවිවල ක්‍රියාත්මක නඩු අවසන් වන තෙක් එම නඩු ක්‍රියාත්මක තත්වයේ පවතින නඩු වශයෙන් වාර්තා කිරීමට සිදු වන බව. | නඩු සම්බන්ධ සියලු තොරතුරු හා යාවත්කාලීන කළ වාර්තා පවත්වා ගත යුතුය. |

නඩුවලින් ත්‍යාග අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ තොරතුරු නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි විධිමත්ව නොතිබීම.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 ජනවාරි 01 දිනට පැවති රු.1,973,908 ක ලැබිය යුතු හිඟ ආදායමෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ දී අයකර නොතිබුණු බැවින් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි. | 2013-2020 දක්වා ලැබිය යුතු ආදායම පිළිබඳ කාලවිශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇති බව. | ලැබිය යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත 49(5) වන වගන්තිය | • නීති විරෝධි කටයුතුවල යෙදුණු අයට විරුද්ධව පැවරුණු නඩු පිළිබඳ වාර්තා ලබා ගෙන නොතිබුණි. | නඩු පිළිබඳ වාර්තා ලබා ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරන බවත් අධිකරණවලින් අදාල වාර්තා ලබා ගැනීම ප්‍රායෝගික නොවන බව. | අදාල නඩු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| | | • වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළයුතු වුවත් 2014 සිට 2020 දක්වා නඩු 3001ක් සිදුකර තිබුණ ද 2014, 2017, 2018 හා 2020 වර්ෂ සඳහා කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණි. | නඩු වාර්තා ලැබීම ප්‍රමාද වීම, නිලධාරීන් වවුචර ඉදිරිපත් කිරීම ප්‍රමාද වීම ආදි හේතු නිසා ත්‍යාග මුදල් ගෙවීමට ප්‍රමාද වන බවත් ත්‍යාග මුදල් ලැබීම ප්‍රමාද වුවද වසරින් වසර සිදු කරන වැටලීම් ප්‍රමාණය ඉහළ ගොස් ඇති බැවින් නිලධාරීන්ගේ පසුබෑමක් සිදු වී නොමැති බව. | වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133(1) හා 2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2020 වර්ෂය සඳහා අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට නොහැකිවීමත් 2021 වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කරන බව. | අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.798,616 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.4,986,601 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,187,985 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ආදායම් ප්‍රවණතා | 2020 | 2019 | ප්‍රතිශතය | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| | රු. | රු. | % | |
| රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම | 2,039,667 | 9,534,248 | 78.6 | වැටලීම් ප්‍රමාණය වැඩි වී තිබුණ ද රාජසන්තක කළ භාණ්ඩ විකුණුම් ආදායම අඩු වී තිබිණි. |
| වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට දීමනා ගෙවීම් | 1,241,051 | 4,547,648 | 72.7 | නිම වූ නඩුවලට අදාල නඩු වාර්තා ලබා ගෙන ත්‍යාග ගෙවීම සඳහා කටයුතු කර නොතිබිණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.8,612,255 ක මුදල් ශේෂයෙන් ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු මුදල් හා රජයේ දායකත්වය නිරූපණය කරනු ලැබුව ද ගෙවිය යුතු දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.1,244,460 ක් පමණක් පෙන්වා තිබුණි. මේ අනුව ඉතිරි රු.7,367,795 ක මුදලට හිමිකම් කියනු ලබන ත්‍යාගලාභීන් හා ඊට අදාල රාජ්‍ය ආදායම හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. කොවිඩ් තත්ත්වය හේතුවෙන් ත්‍යාග ලැයිස්තු සකස් කිරීම ප්‍රමාද වීමෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇති බවත් 2021 දී නඩු කටයුතු අවසන් වූ විට වැටලීම්වලට අදාල දීමනා ගෙවා ඉතිරිය රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරන බව. | හිමිකම් කියනු ලබන ත්‍යාගලාභීන් හා ඊට අදාල රාජ්‍ය ආදායම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී විමර්ශන අංශය හා දිස්ත්‍රික් ධීවර කාර්යාල 15 හරහා නඩු 536ක් පවරා තිබුණ ද දිස්ත්‍රික් ධීවර කාර්යාල 3 කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් මුදල් ත්‍යාග අරමුදලට බැර වී තිබුණි. විමර්ශන අංශය හා අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල කිසිවකින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | නඩු කටයුතු අවසන් නොවීම හේතු වී තිබුණු බවත් අධිකරණ කටයුතු දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැර හෙයින් ප්‍රමාදයන්ට දෙපාර්තමේන්තුවට වගකිව නොහැකි බව. | නඩු පිළිබඳ වාර්තා විධිමත්ව පවත්වාගෙන යාමටත් මුදල් ගෙන්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය හා දිස්ත්‍රික් ධීවර කාර්යාල 15 සඳහා සැලසුම් කරන ලද පරීක්ෂණ වැටලීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ අතර කරන ලද වැටලීම් ප්‍රමාණය පමණක් ඉදිරිපත් කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල සිදුකරන ලද වැටලීම්වල ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය. | කොවිඩ් තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත පරිදි වැටලීම් සිදු කිරීමට නොහැකි වීම මත ප්‍රගතිය අඩු වී ඇති බව. | වැටලීම්වල ප්‍රගතිය පරීක්ෂා කළ හැකි වන පරිදි සැලසුම් කරන ලද වැටලීම් ප්‍රමාණය, කරන ලද වැටලීම් ප්‍රමාණය ආදි තොරතුරු වාර්තා පවත්වා ගත යුතුය. |